# සේවා නයුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය- 2010

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ශේෂ පත්‍ර දිනට වාහන වල ඉදිරියට ගෙන යන අගය සහ ඒවායේ සාධාරණ අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොමැති බව තහවුරු කර ගැනීමට මණ්ඩලය වාහන ප්‍රත්‍යාගණනයක් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 3 ට අනුකූලව කොටස් විකිණීමෙන් සිදු වූ රු. 16,429,168 ක අලාභය අවසන් ගිණුම් වලින් වෙනම දැක්විය යුතු වුවද, එය ආයෝජන ආදායම් වලින් අඩුකර පෙන්වා තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.**

(අ) වියන නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2009 දෙසැම්බර් මසට අදාල පොලී ලැබීම් රු. 5,044,101 ක් 2010 වර්ෂයේ ජනවාරි ලැබීම් ලෙස ගිණුම් ගත කර ඇති අතර, 2010 වර්ෂයේ දෙසැම්බර් මසට ලැබිය යුතු පොලී රු. 4,822,780 ක් ගිණුම් වලට ගලපා නොතිබීම හේතුවෙන් වියන නිවාස ණය සඳහා පොලී ලැබීම් ගිණුම් ගත කිරීමේ දී රු. 221,321 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(ආ) 2009 දෙසැම්බර් මසට අදාල ණය වාරික ලැබීම් මත ප්‍රාග්ධනය අඩුවීම රු. 1,980,146 ක් 2010 වර්ෂයේ ලැබීම් ලෙස ගලපා ඇති අතර, 2010 දෙසැම්බර් මසට අදාල ණය වාරික ලැබීම් රු. 8,574,422 ක් ගලපා නොතිබීම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 ට වියන ණය යෝජනා ක්‍රමයේ ප්‍රාග්ධනය රු. 6,594,276 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | |
| (i) 5 වන වගන්තිය | මණ්ඩලයේ සාමාජිකයන් 9 කින් සමන්විත විය යුතු වුවද සාමාජිකයන් 8 කු පමණක් පත් කර තිබුණි. |
| (ii) 8 ( ඒ ) වගන්තිය | විධිවිධාන පරිදි වර්ෂය අවසානයට අරමුදලේ සෑම සාමාජිකයෙකුගේම පෞද්ගලික ගිණුමේ බැරට ඇති ශේෂය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර අරමුදලේ එක් එක් සාමාජිකයා වෙත මණඩලය විසින් නිවේදනය කර නොතිබුණි.2010 දෙසැම්බර් 31 දින වනවිට 85% ක පමණ සකීය සාමාජිකයන් සඳහා ගිණුම් ප්‍රකාශන යවා ඇති බව සභාපති දැනුම් දී තිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 130 හා 1998 මාර්තු 18 දිනැති චක්‍රලේඛය හා අංක 26/47 හා 1997 නොවැම්බර් 19 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | 4.2% වන සේවක ණය පොළී අනුපාතය මත සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සඳහා ණය ලබා නොදිය යුතු බව සඳහන් කර තිබුණ ද, මණ්ඩලය ඊට පටහැනි ලෙස කටයුතු කරමින් ඉහත පොළී අනුපාතයට හෝ ඊට අඩු පොළී අනුපාත යටතේ සේවක ණය ලබා දී තිබුණි. ඒ අනුව 2010 දෙසැම්බර් 31 වන විට ඉහත පොළී අනුපාතය මත ලබා දුන් රු. 309,405,813 ක ණය ශේෂයක් අයවීමට තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 2006 ඔක්තෝබර් 09 දිනැති අංක 29 චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලයේ සභාපතිවරයා විසින් වාහන දෙකක් තම රාජකාරි සහ පෞද්ගලික භාවිතය සඳහා යොදාගනු ලබන අතර, එම වාහන දෙක සඳහාම මාසිකව පෙට්‍රල් වාහනය සඳහා රු. 20,000 ක් ද ඩීසල් වාහනය සඳහා රු. 14,000 ක් ද බැගින් ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | අංක පීඑෆ්/පීර් 5 හා 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව දිරිගැන්වීමේ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 59,960,950 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඈ) | අංක 42 හා 2010 දෙසැම්බර් 14 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය | මෙම චක්‍රලේඛයේ 1 හා 2 වගන්ති වලට පටහැනි වන පරිදි සමාලෝචිත වර්ෂයේ දී රු. 40,178,847 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. 8 වන වගන්තිය පරිදි චක්‍රලේඛයේ විධිවිධාන වලට පරබාහිරව වන පරිදි ප්‍රසාද දීමනා ගෙවන්නේ නම් අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | අංක 30 හා 2006 සැප්තැම්බර් මස 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය - ඇමුණුම II (6) ඡේදය | වැටුප් වර්ධකයේ මූල්‍ය අගය අඩුවීමේ වෙනස ගැලපීම් කර ඉදිරියට ලබාදීම වෙනුවට පැරණි වැටුප් ක්‍රමය යටතේ වැටුප් වර්ධක ලබාගත් කාල සීමාවට ද එම අඩුවීම ගණනය කර අතීතයට බලපාන පරිදි වැටුප් වර්ධක ගැලපීම සිදුකර ඇත. |
| (ඊ) | 2005 අගෝස්තු 31 දිනැති අංක 523 වැනි අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | අධ්‍යයන පාඨමාලා සඳහා නිලධාරීන් වෙනුවෙන් රු. 10,000 ක උපරිමයකට යටත්ව වූ මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කළ හැකි වුවත් අවස්ථා දෙකකදී එම සීමාව ඉක්මවා රු. 71,750 ක වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (උ) | අංක ඩීඑම්ඒ/2009(1) හා 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ 04 වගන්තිය හා මු.රෙ.134 (3) වගන්තිය | අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ලබා දී නොතිබුණි. |

(ඌ) ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි (මු.රෙ) මු.රෙ. 756 (1) — විධිමත් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

1.2.4 <u>නිරවුල් නොකල ශේෂ</u>

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ආයෝජන පොළී ලැබිය යුතු කාල සීමාව පසු වී වර්ෂයක් ගත වී ඇත රු. 26,107,769 ක් හා වර්ෂ 8 ක් ඉකුත් වී ඇති රු. 31,365,629 ක් සමග එකතුව රු. 57,473,398 ක් වූ ලැබිය යුතු පොළී ආදායම 2010 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂය වෙනුවෙන් වාහන අංගනයෙන් ලැබිය යුතු වාහන නැවැත්වීමේ ගාස්තු රු. 103,484 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ සේවයෙන් ඉවත් වී වසර 1 සිට වසර 11 දක්වා කාලයක් ගත වී ඇති, එමෙන්ම ආයතනය විසින් පාරිතෝෂක මුදල් ද ගෙවා ඇති නිලධාරීන් 15 දෙනකුගෙන් තවදුරටත් අයකර ගත යුතු අයවීම් වල අගය රු. 604,644 ක් වුවත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය 2011 අප්‍රේල් 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 2 කට වැඩි කාලයක් ගත වී ඇතත් ආයතනය විසින් නිරවුල් නොකරන ලද ගෙවිය යුතු හිඟහිටි ශේෂය රු. 979,008 කි.

(ඉ) මණ්ඩලයේ බැරකම් යටතේ දැක්වෙන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ගිණුමේ රු. 6,699,317 ක් වූ ශේෂය 1995 සිට ද, ආපසු ගෙවන ප්‍රතිලාභ ගිණුමේ රු. 11,458,846 ක් වූ ශේෂය 2001 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ද අඛණ්ඩව වැඩි වී ඇති නමුත්, එම ශේෂ නිරවුල් කිරීම මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය. "මෙම ගිණුම පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කර සාමාජිකයින් හැකි සෑම අවස්ථාවකදීම දැනුවත් කර එම මුදල් නැවත ඔවුන්ට ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා සඳහන් කර තිබුණි.

### 1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 1999 සිට ක්‍රියාත්මක කරන මූල්‍ය කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මුදල් අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන මණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් 1993 වර්ෂයේ සිට නිල ඇඳුම් ලබා දීම සිදුකර තිබුණු අතර, මේ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 6,872,288 ක වියදමක් දරා තිබුණි.

### 1.2.6 නොසැසඳුණු ගිණුම් ශේෂ

අවසන් ගිණුම් උපලේඛන සමග ආශ්‍රිත උපලේඛන සැසඳීමේ දී පහත සඳහන් පරිදි ණය ශේෂ වල වෙනස්කම් පැවතුණි.

| | ණය ලේඛනයට අනුව ශේෂය | උපලේඛනයට අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වාහන ණය | 571,250 | 739,695 | 168,445 |
| උත්සව අත්තිකාරම් | - | 25,000 | 25,000 |
| උත්සව ණය | 1,200 | 11,400 | 10,200 |
| විශේෂ ණය | 13,761 | 122,008 | 108,247 |
| විශේෂ ආපදා ණය | 2,635,763 | 3,224,682 | 588,919 |

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 14,588,421,261 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 14,219,995,203 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ වැඩිවීම රු. 368,426,058 ක් විය. 2010 වර්ෂයේ දී ආයෝජන මත ලැබුණු ආයෝජන ආදායම් වැඩිවීම මෙම අතිරික්තයේ වැඩිවීමට හේතු වී තිබුණි.

## 2.2 <u>මූල්‍ය සමාලෝචනය</u>

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) මණ්ඩලයේ පෙර වර්ෂයේ අතිරික්තයේ වැඩිවීම හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩිවීම සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩිවීම රු. 4,068,802,906 කින් අඩු වී තිබුණි. ඒ අනුව සාමාජිකයන් වෙත ලබාදෙන ලද ලාභාංශය පෙර වර්ෂයට වඩා 0.5% කින් අඩු වී තිබුණි.

(ආ) <u>**අරමුදලේ සාමාජිකයන්ගේ හිමිකම, මුළු දායක මුදල හා ප්‍රකාශිත පොළියේ සමුච්චිත අගයේ වර්ෂ 5 තුළ විචලන**</u>

පසුගිය වර්ෂ 05 ක් තුල මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකම හා එම හිමිකම් වලට අයත් මුළු දායක මුදල් හා සමුච්චිත පොළී ලෙස බෙදී ගිය ආකාරය පහත දැක්වේ.

| වර්ෂය | මුළු දායක මුදල | සමුච්චිත පොලිය | සාමාජිකයන්ගේ හිමිකම |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2006 | 33,199.20 | 32,499.70 | 65,698.90 |
| 2007 | 36,798.97 | 39,134.10 | 75,933.07 |
| 2008 | 40,712.25 | 48,157.80 | 88,870.05 |
| 2009 | 43,875.10 | 59,181.98 | 103,057.08 |
| 2010 | 48,148.28 | 71,704.59 | 119,852.87 |

ඉහත තොරතුරු අනුව 2010 වර්ෂය වන විට මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකමින් 40% ක් දායක මුදල්ව තිබූ අතර, 59% ක් සමුච්චිත පොළිය වී තිබුණි. එමෙන්ම 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී සාමාජිකයන්ගේ මුළු හිමිකම 16% කින් වර්ධනය වී තිබුණු නමුත් එකී වර්ෂයේදී මුළු දායක මුදල වර්ධනය වී තිබුණෙ 9% කින් පමණි.

## 2.3 <u>ආයෝජන හා ආයෝජන ආදායම්</u>

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.මිලියන 101,235 ක් වූ ආයෝජන, මිලදී ගැනීම් සහ කල්පිරීම් ගැලපීමෙන් පසුව වර්ෂය අවසාන ශේෂය රු.මිලියන 118,984 ක් දක්වා වැඩිවී තිබුණි.

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) කෙරවලපිටිය තාප විදුලි ව්‍යාපෘතියෙහි ආයෝජනය වෙනුවෙන් 2010 වර්ෂයේ දී ලැබිය යුතු මුළු පොලී ප්‍රමාණය රඳවා ගැනීම් බදු අඩු කිරීමෙන් පසුව රු. 182,879,240 ක් 2011 අප්‍රේල් 30 දින වන විට ද ලැබී නොතිබුණි.

(ආ) <u>කෙටිකාලීන රීපෝ ආයෝජන</u>

මණ්ඩලය විසින් රු. 500,000,000 ක මුදලක් ලංකා බැංකුවේ 2007 වර්ෂයේ සිට වසරක් පාසා අළුත් කිරීමේ පදනම මත රීපෝ ආයෝජනයක් සිදුකර තිබුණි. ඉන් රු. 490,000,000 ක ආයෝජිත මුදල සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබානොගෙන සභාපතිගේ අනුමැතිය පමණක් ලබා ගෙන තිබුණි.

(ඇ) <u>කොටස් ආයෝජන</u>

(i) සමාගම් කොටස් වල ආයෝජනය කර ඇති නමුත් ප්‍රාග්ධන වෙළෙඳ පොලේ දීර්ඝකාලීනව ගනුදෙනු සිදුනොවීම නිසා ප්‍රාග්ධන ලාභ හෝ ලාභාංශ ආදායම් නොමැතිව සමාගම් 12 ක ආයෝජන රු. 59,294,528 ක මුදලක් නිශ්ක්‍රියව පැවතුණි. තවද සමාලෝචිත වර්ෂය වන විට එම සමාගම් අතුරින් සමාගම් 03 ක් ඈවරකරණයට ද ලක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී සමාගම් කොටස් වල ආයෝජනය කරන ලද රු. 181,000,085 ක් වෙනුවෙන් ප්‍රාග්ධන ලාභ වශයෙන් රු. 1,206,512 ක් ලැබී තිබූ අතර, ලාභාංශ ආදායම ලැබී නොතිබුණි.

(iii) එක්තරා පෞද්ගලික සමාගමක පිරිවැය රු. 29,393,665 ක් වූ කොටස් 1,075,690 ක් සමාලෝචිත වර්ෂයේ දී රු. 12,964,496 ක මුදලකට විකිණීමෙන් මණ්ඩලයට රු. 16,429,168 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම සමාගමින් 1994 වර්ෂයේ සිට කොටස් මිලදී ගෙන තිබුණු අතර, 1998 වර්ෂයේ සට එම කොටස් නිශ්ක්‍රියව පැවතීම නිසා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද 1998 හා 2005 වර්ෂ වෙනුවෙන් පමණක් එම සමාගමෙන් රු. 5,378,845 ක් හා රු. 1,085,400 ක් ලාභාංශ ආදායම් වශයෙන් ලැබී තිබුණි.

## 2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ගිවිසුම් කඩ කිරීමක් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් වන්දි ඉල්ලා පවරා තිබූ නඩුවකදී විත්ති පාර්ශවය වශයෙන් නිවැරදිව අධිකරණයට කරුණු දැක්වීමට කටයුතු නොකිරීම හේතුකොට ගෙන රු.මිලියන 21.9 ක වන්දියක් ගෙවීමට සිදු වී තිබුණි. සභාපතිවරයාගේ පිළිතුරේ "මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අභියාචනයක් ලයිස්තු ගත කර ඇත" යනුවෙන් දක්වා තිබුණි.

(ආ) බැංකු සැසඳුම් අනුව එක් බැංකු ගිණුමක 2008 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ  රු. 17,230,663 ක මුදල් ඇනවුම් තැන්පතු 2011 අප්‍රේල් 30 වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ඇ) කල්පිරී ඇතත් සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගැනීමට නොහැකි වී ඇති ආයෝජන රු. 19,624,641 ක් සහ ලැබිය යුතු පොළී රු. 33,365,633 ක් වෙනුවෙන් මණ්ඩලය වෙන්කිරීම් සිදුකර තිබුණ අතර, මෙම ආයෝජන හා පොළී වසර ගණනක සිට මණ්ඩලය වෙත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) 2010 පෙබරවාරි 16 වන ගබඩාවට ලැබී තිබුණු රු. 553,874 ක් වටිනා දැනුවත් කිරීමේ පත්‍රිකා තොගයක් 2011 ජනවාරි 24 විගණිත දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 2.5 හඳුනාගත් පාඩු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) පිරිවැය රු. 12,996,933 ක් වූ ස්ථාවර වත්කම් වල ලියාහල අගය රු. 2,044,420 ක් විය. මෙම මුදල කපාහැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම වටිනාකමට අදාල වත්කම් ලැයිස්තුවක් හෝ කපා හැරීමට හේතු දැක්වෙන විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ආ) රජයේ තක්සේරුකරුගේ නිර්දේශය නොසලකා වැඩි මුදලකට ගොඩනැගිලි කුලියට ගැනීම නිසා ගොඩනැගිලි 2 ක් වෙනුවෙන් පිළිවෙලින් මාසිකව රු. 35,000 ක් හා රු. 150,000 ක අලාභයක් සිදු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයට සිදු වූ මුළු අලාභය රු. 2,220,000 ක් විය.

## 2.6 නිශ්කාර්ය වියදම්

මණ්ඩලයේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා 2010 හා ඊට පෙර වර්ෂයන්හි ද මිලදී ගත් එහෙත් ප්‍රයෝජනයට නොගත් ඉතිරි නිල ඇඳුම් වල වටිනාකම රු. 1,660,657 ක් විය. නිල ඇඳුම් අවශ්‍යතාව පිළිබඳ නිවැරදිව දත්ත එක්රැස් කිරීමකින් තොරව තොග අතිරික්ත ලෙස මිලදී ගැනීම හේතුවෙන් මෙසේ නිශ්කාර්ය වියදම් දරා තිබුණු බව අනාවරණය වුණි.

## 2.7 අනුමැතිය නොලත් ගනුදෙනු

සෙනසුරාදා හා ඉරිදා දිනයන් වෙනුවෙන් අතිකාල සඳහා පැයකට ගෙවනු ලබන පැය 1 1/2 ක දීමනාවට අමතර වශයෙන් එම දිනයන්හිදී පැය 8 ක් සම්පූර්ණ වීමත් සමඟ දිනක වැටුපක් ද එකතු කර අතිකාල සඳහා ගෙවීම් කිරීම නිසා මණ්ඩලය විසින් වර්ෂය තුළදී රු. 5,379,201 ක අමතර වියදමක් දරා තිබුණි. මේ සඳහා අමාත්‍යාංශ හා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ද නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.
(ආ) දායක මුදල් ප්‍රමාදවීම, අධිභාර අය කිරීම සහ නීති මගින් කටයුතු කිරීම.
(ඇ) අයවිය යුතු මුදල්.
(ඈ) වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන යැවීම.
(ඉ) පනතට කළ යුතු කාලීන සංශෝධන.
(ඊ) ආයෝජන.